මුහුණට මුහුණ

# සාම්ප්‍රදායික නර්තන කලාව ජාත්‍යන්තරයට ගෙනයන

## දිනේෂ් ඇපාසිංහ

**ශ්‍රීනාත් මද්දුමගේ විසිනි**

මම ශාලාව ළඟට යනවිටත් පුහුණුවීම් ඇරඹිලා. ඈතටම බෙර හඬ ඇහෙනවා. මට දැනුණෙ ලංකාවේ දවසක් වගෙයි. මම ශාලාවට ඇතුල් වුණේ සතුටක් හිතේ පුරවාගෙන. ශලාවේ කෙළවරක දරු දැරියන් රැසක් පිරිවරා ගත් නර්තන ගුරුවරයා මම දුටුවා. දිනේෂ්.. ඔහු දිනේෂ ඇපාසිංහ. මෙයට අවුරුදු ගණනාවකට කලින් දවසක ලංකාවේදි මට ඔහු පළමු වරට හමුවුණ හැටි මට මතක් වුණා. ඔහු ඉසිපතන විද්‍යාලයේ නර්තන ගුරුවරයාව සිටි ඒ යුගය මට හොඳට මතකයි. පාසල් වේදිකාවක මා දුටු විශිෂ්ට ප්‍රසංග අතරින් එකක් ලෙස මම අදත් සලකන ඉසිපතන විද්‍යාලයේ ප්‍රසංගයේ නර්තනාංග නිර්මාණය කරනු ලැබ තිබුණේ දිනේෂ් විසිනුයි.




ඉන්පසු මම ඔහු දුටුවේ කාලයක ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ සාම්ප්‍රදායික නර්තන ශිල්පීන් සමග එක්ව මඩු යාගයකදීයි.

ඒ මතකය සමගින් ඔහු හා කතා බහකට එළැඹෙන්න මම මුල පිරුවා.

ශ්‍රීනාත් - ඇයි ඔබේ ප්‍රසංගයට මයුර අභිරංගන කියා නම තිබ්බෙ?

දිනේෂ් - මේ මුලු නර්තන ප්‍රසංගයේම මයුර සන්දේශය මූලික කරගෙන තමයි සෑම නර්තනාංගයක්ම පෙළ ගස්වා තියෙන්නෙ.

ශ්‍රීනාත් - ඇයි මයුර සන්දේශය මේ සඳහා තෝරා ගත්තෙ?

දිනේෂ් - මයුර සන්දේශය අපේ සාහිත්‍යයේ විශේෂිත සන්දේශ කාව්‍යයක්. ඒ එක්කම අපේ වන්නම් වලිනුත් විශේෂ තැනක් ගන්නවා මයුරා වන්නම. කොහොමත් මොනරා කියන්නෙ ලස්සනම කුරුල්ලෙක්නෙ. මයුරා වන්නම වටා පෙළ ගැසී තිබෙන නැටුමත් ඉතා අලංකාරයි. ඒ නිසා මුල සිටම අපේ සම්ප්‍රදාය රැකගන්නත් මයුරා වන්නමේ අලංකාරය ප්‍රසංගයට එක්කර ගන්නත් අපි උත්සාහ කළා. නිකම්ම නැටුම් ප්‍රසංගයක් කරනවාට වඩා යම් අර්ථයකින් යුත් නැටුම් ප්‍රසංගයක් කරන එක තමයි මගේ අරමුණ.

ශ්‍රීනාත් - මේ ප්‍රසංගය පිළිබඳව විස්තරයක් කරන්න පුලුවන්ද?

දිනේෂ් - මේ ප්‍රසංගයේ සම්ප්‍රදායික නැටුම් විශාල ප්‍රමාණයක් තියෙනවා. විශේෂයෙන් විදේශ රටකදී කිසිදිනෙක දකින්නට නොලැබුණ අපේ සාම්ප්‍රදායික නර්තනාංග වල වැදගත් අංගයක් වන සත්පත්තිනි නර්තනය පවා මේ ප්‍රසංගයේදී අපි ඉදිරිපත් කරනවා. ලංකාවේදී පවා මෙය දුර්ලභ නර්තනයක්. වියනක් යටින් තමයි සත් පත්තිනි ගෙන්වන්න ඕනෙ. මේ සියල්ල පිළිබඳව මම මගේ සිසු සිසුවින්ට පැහැදිලි අවබෝධයක් ලබා දීලා තිබෙනවා.

මයුර අභිරංගන කියන්නෙ තවත් එකමත් එක ප්‍රසංගයක් නම් නෙවෙයි.

ශ්‍රීනාත් - සාමාන්‍යයෙන් සත්පත්තිනි වැනි නර්තනයක් ඉදිරිපත් කරන විට ඒ හා බැඳුණ ඇදහිලි ආදිය තිබෙනවා නේද?

දිනේෂ් - ඔව්. සාමාන්‍යයෙන් මෙවැනි නැටුමක් ඉදිරිපත් කරන විට දවස් 7 ක් පේ වෙන්න ඕනෙ. මම මේ බව අපේ දරුවන්ට කිව්වහම ඒ අය ඒ කැපවීම කරන්න එකඟ වුණා. දැන් ඉඳන්ම මස් මාලු වලින් වැළකිලා ඒ අය ඒ

> . සාමාන්‍යයෙන් මෙවැනි නැටුමක් ඉදිරිපත් කරන විට දවස් 7 ක් පේ වෙන්න ඕනෙ. මම මේ බව අපේ දරුවන්ට කිව්වහම ඒ අය ඒ කැපවීම කරන්න එකඟ වුණා. දැන් ඉඳන්ම මස් මාලු වලින් වැළකිලා ඒ අය ඒ සඳහා සූදානම් වෙනවා. මම හිතනවා ඒ සිතුවිල්ලම මම ලැබූ ජයග්‍රහණයක් කියලා. ඒකෙන් පෙනෙනවා මෙහේ ඉන්න දරු දැරියන් අපේ සංස්කෘතියට අපේ නැටුමට මොන තරම් ආදරයක් කැපවීමක් තියෙනවද කියලා.

සඳහා සූදානම් වෙනවා. මම හිතනවා ඒ සිතුවිල්ලම මම ලැබූ ජයග්‍රහණයක් කියලා. ඒකෙන් පෙනෙනවා මෙහේ ඉන්න දරු දැරියන් අපේ සංස්කෘතියට අපේ නැටුමට මොන තරම් ආදරයක් කැපවීමක් තියෙනවද කියලා.

ශ්‍රීනාත් - දැන් සමහර තරුණ අය කියනවා සම්ප්‍රදායික නැටුම් එක දිගය බලා සිටීම නීරසයි කියලා. ඔබ ඒ ගැන මොකද කියන්නෙ?

දිනේෂ් - මම ඒකට එකඟ වෙන්නෙ නැහැ. මෙතනදි අපි කල්පනා කරන්න ඕනෙ සම්ප්‍රදායික නැටුම් නටන ස්ථාන. කමත් වල . මඩු වල . තොයිල් පලවල් වල වැනි ස්ථාන වල රඟ දක්වන නර්තන කොහොමද විදුලි ආලෝකයෙන් පිරි නූතන ශබ්ද ප්‍රයෝග විලින් යුත් ශාලාවකට ගේන්නෙ කියන කාරණය. ඒ ගැන කල්පනා කළොත් අර මුලින් කියූ කරුණ බොරු කරන්න අපට පුලුවන්. ගම් මඩුවක් ගැන කල්පනා කළොත් එය දවස් ගණනාවක් නටනවා. දහඅට සන්නියත් රැයක් එළිවෙනකල් නටනවා. නමුත් වේදිකාවේ එය කරන්න බැහැ. එය අපි තේරුම් ගන්න ඕනෙ. මම ශ්‍රී ලංකාවේ සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබද්දි මේ සම්බන්ධයෙන් ඉතා විශාල අවබෝධයක් ලබා ගෙන තිබෙනවා. ඒ දැනුම නිසි ලෙස භාවිතා කර නරඹන්නාට වෙහෙසක් නොදැනෙන රසවත් ප්‍රසංගයක් කරන ආකාරය මම දන්නවා. මයුර අභිරංග නය නරඹන විට ඔබටම මෙය තේරේවි.

ශ්‍රීනාත් - මේ ප්‍රසංගයට දායක වන අනෙක් අය කවුද?

දිනේෂ් - මේ ප්‍රසංගය පුරාවටම සංගීතය ඉතා ප්‍රබල ලෙස භාවිතා කරනවා. මට මේ වෙලාවේ සංගීතයෙන් විශාල සහයෝගයක් ලබා දෙන්නේ අග්‍රා ප්‍රේමරත්න. ඔහු සංගීතඥ ෂෙල්ටන් ප්‍රේමරත්න ශූරීන්ගේ පුතා. ඔහු සංගීතයෙන් මේ නැටුමට නව ජීවයක් ලබා දෙනවා.

ශ්‍රීනාත් - අනිත් වැදගත්ම කාරණය තමයි මේ ප්‍රසංගයේ අපි පාවිච්චි කරන්නේ සජීවී සංගීතය බව. කලින් පටිගත කළ සංගීතයක් අපි යොදාගන්නෙ නැහැ.

දිනේෂ් - ප්‍රසංගයේ ඇඳුම් නිර්මාණය කරන්නේ අප විසින්මයි. ආලෝකය සඳහා දසුන් ගජමන් සහය දෙනවා.

ඒ එක්කම මම කියන්න කැමතියි මේ ප්‍රසංග යට මෙල්බන් නුවර තෝමස්ටවුන් ග්ලෙන් වේවලි සහ බ්‍රිස්බේන් නුවර මගේ සියලුම නර්තන පන්ති වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් මේ ප්‍රසංගයට දායක වෙන බව.

ශ්‍රීනාත් - ප්‍රසංගයේ පෙළ ගැස්ම ගැන යමක් කිව්වොත්

දිනේෂ් - මේ ප්‍රසංගයේ නර්තනාංග විස්සක් තිබෙනවා. ඉතා හොඳ නිර්මාණ ටිකක් ඉදිරිපත් කිරීම තමයි මගේ බලාපොරොත්තුව. කිසි දිනෙක මෙල්බන් ජනතාව නොදුටු අංග ඉදිරිපත් කරන්න අපි උත්සාහ කරනවා.

ශ්‍රීනාත් - මේ වතාවේ කෝලම් සම්ප්‍රදායේ නැටුම් ගැන අවධානයක් යොදන්නෙ නැද්ද?

දිනේෂ් - ඇයි නැත්තෙ. තියෙනවා.. අපේ කෝලම් නැටුම් වලදි හමුවන නාග රාක්ෂ ගුරුළු රාක්ෂ නාග කන්‍යා යන චරිත සියල්ල එකට එකතු කර නිර්මාණයක් ඉදිරිපත් කරනවා. ඒ එක්කම කුඩා රංගන ශිල්පීන් දෙදෙනකු සමග මම ගිණි සිසිල අංගයක් ද ඉදිරිපත් කරනවා.

ශ්‍රීනාත් - ප්‍රසංගය පැවැත්වෙන්නෙ?

දිනේෂ් - ජූලි මස 11 වන දින සවස 5ට සවුත් මොරෑන්ග් හි ජ්ලෙන්ටි රේන්ජ් ආර්ට් ඇන්ඩ් කන්වෙන්ෂන් සෙන්ටර් හිදී තමයි ප්‍රසංගය පැවැත්වෙන්නේ.

ශ්‍රීනාත් - ඔබට මේ ගැන විශේෂයෙන් කියන්න දෙයක් තිබෙනවාද?

දිනේෂ් - ඔව්. මේ ප්‍රසංගය සාර්ථක කර ගන්නට මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමාපියන් දෙන සහයෝගය වචන වලින් විස්තර කරන්න බැරි තරම්. මෙපමණ සාර්ථක ප්‍රසංගයක් කරන්නට මට හැකියාව ලැබෙන්නේ ඔවුන්ගෙ ' කැපවීම සහ ශක්තිය නිසායි. ඒ සියලු දෙනාටම මම අනේක වාරයක් ස්තුති කරන්න කැමතියි.

දිනේෂ් ඇපාසිංහ තරුණ නර්තන ගුරුවරයාගේ හැකියාව සහ දක්ෂතාව පිලිබිඹු කරන මයුර අභිරංගන ප්‍රසංගය අති සාර්ථක එකක් වන බව මගේ විශ්වාසයයි. ඒ ඔහු සම්ප්‍රදාය නොබිඳිමින් අපූරු නර්තන නිර්මාණ කිරීමේ මනා හැකියාවක් ඇති ශිල්පියෙකු බව මා හොඳින් ම දන්නා නිසායි.

මයුර අභිරංගන ප්‍රසංගය නරඹන සන්නසේ පාඨක ඔබ සැමද මා අනුමත කරන බව මට විශ්වාසයි.

